**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 20 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.35,000 ක් වටිනා බිම් තරාදියක් ගිණුම්වලින් අත්හැරීම නිසා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමේ ශේෂය රු.35,000 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රු.12,645 ක් වූ අස්ථානගත පුස්තකාල පොත් අගය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 22 දින රු.2,358,850 ක් වූ ඍජු බැරකිරීම් මුදල් ලැබීමක් වශයෙන් සටහන් නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.2,358,850 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.66,705,732. ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.6,692,354 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු. 1,737,061 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,955,293 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,955,293 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.20,681,195 කින් වැඩිවීම හා වියදම් රු.15,725,902 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 2,289 | 1,983 | 557 |
| (ii) බදු කුලී | 4,361 | 4,361 | 250 |
| (iii) බලපත්‍ර ගාස්තු | 194 | 194 | -- |
| (v) වෙනත් ආදායම් | 67 | 67 | -- |

2.2.2 <u>වරිපනම් බදු</u>

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.661,138 න් රු.375,291 ක් හෙවත් සියයට 56.8 ක් පමණක් අයකර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.493,536 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.1,018,262 ක් වූ අතර ඉන් රු.766,253 ක් හෙවත් සියයට 75.2 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.3 <u>අක්කර බදු</u>

2015 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.31,648 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.24,604 ක් හෙවත් සියයට 77.7 ක් පමණක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන බිල් කිරීම රු.140,609 ක් වූ අතර ඉන් රු.91,117 ක් හෙවත් සියයට 64.8 ක් අයකරගෙන තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.52,364 ක් විය.

2.2.4 <u>බදු කුලී</u>

2015 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී ශේෂය රු.383,280 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.133,642 ක් හෙවත් සියයට 35 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.5 <u>ව්‍යාපාර බදු</u>

සභාව විසින් ව්‍යාපාර බදු සම්බන්ධයෙන් 2016 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදු කර තිබුණද, එම සමීක්ෂණයෙන් හඳුනා ගත් ව්‍යාපාරවලින් බදු අයකරගැනීමට කටයුතු නොකිරීම නිසා ඌන බිල් කිරීමක් සිදු වී තිබුණි.

2.2.6 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 2,657,215 |
| (ii) | මුද්දර ගාස්තු | 7,000,000 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) **කඩකාමර බදුදීම/ භූමිය කුලියට දීම**

(i) සභාව විසින් කඩකාමර 26 ක් පුද්ගලයින්ට ලබාදීමේදී නිසි ටෙන්ඩර් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර වර්ෂ තුනෙන් තුනට අළුත් කරමින් යන මෙම බදු කුලී ගිවිසුම් තුළ මාසිකව අයකරන කුලිය රු.3,000 ක් විය. තවද, 2008 වර්ෂයේ සිට මේ දක්වා වසර 09 කට ආසන්න කාලයක් මෙම වෙළඳසැල් බදු දී තිබුණද, කිසිදු තක්සේරුවක් කර නොතිබුණි.

(ii) කඩකාමර අංක 10 හි මුල් බදුකරු විදේශ ගත වන බව පවසමින් තමාගේ බදු අයිතිය වෙනත් කෙනෙකුට පවරාදීමට යෝජනා කර තිබූ අතර 2015 මැයි 14 දින පැවති සභා රැස්වීමේදී මෙම යෝජනාව සම්මත වී, අදාල පැවරුම් ගාස්තු අයකරගෙන තිබුණද 2017 ජූලි 30 න් අවසන් වන බදු ගිවිසුමද පැවතියේ පැරණි බදුකරු නමිනි.

(ආ) **පෙර පාසලෙන් මාසික ගාස්තු අයකිරීම**

සභාව විසින් පෙර පාසල් දෙකක් පවත්වාගෙන ගොස් තිබූ අතර, සුභසාධන අරමුණ යටතේ පවත්වාගෙන යන මෙම කාර්යය තුළ සභාව විසින් ඊට පටහැනිව යමින් එක් පෙර පාසලකින් 2014 වසරේ සිට මේ දක්වා මාසික ගාස්තු ලෙස රු.500 බැගින් රු.487,000 ක් අයකරගෙන තිබුණි.

(ඇ) <u>බෙල්ලන නාරංගහවත්ත ඉඩම බදුදීම</u>

පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සතු තුන්හවුල් කුරුඳුවත්ත හෙවත් නාරංගහවත්ත නැමති ඉඩම ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීම සඳහා සඳහා රු.10,000 ක මාසික බදු කුලියක් හා අවුරුදු තුනෙන් තුන අළුත්වන ගිවිසුමක් මත පුද්ගලික පාර්ශවයකට ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විධිමත් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව මෙම ඉඩම අදාල පාර්ශවයට බදුදී තිබූ අතර ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට අනුව ටෙන්ඩර් භාර ගැනීම හා විවෘත කිරීමේ දිනය වූ 2008 මාර්තු 12 වන දින මෙම පුද්ගලයාට පමණක් ටෙන්ඩර් අයදුම්පත්‍රයක් නිකුත් කර තිබූ අතර 2008 මාර්තු 11 දින සිට බදු ගිවිසුමකට ඇතුළත් වී තිබුණි.

(ii) ප්‍රාදේශීය සභා පනතේ 19(1)(xi)/19(1)(12) වගන්තිය යටතේ ඉඩම බදු දීම සඳහා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) 2008 මාර්තු 11 සිට වසර තුනෙන් තුන අළුත් කරමින් වසර 09 ක් පුරා පවත්වාගෙන ආ මෙම බදු ගිවිසුම තුළ ඉඩමේ වටිනාකමේ ඉහලයාම සළකා බලා නව තක්සේරුවක් සිදු කර ඒ අනුව ලබාගන්නා බදු මුදල ඉහල නංවා ගැනීමට සභාව ක්‍රියා කර නොතිබුණි.

(iv) 2014 වර්ෂයේ සිට බදුකරු විදේශ ගත වන බැවින් ඔහු විසින් නම් කල පුද්ගලික සමාගමක් සමග ගිවිසුමට ඇතුළත් වන ලෙසට සභාවට කර තිබූ දැනුම් දීම මත සභාව 2014 මාර්තු 11 දින සිට 2017 මාර්තු 10 දින දක්වා අදාල පුද්ගලයා සමග ගිවිසුම් ගත වී තිබූ නමුත් 2017 මාර්තු 10 දින අවසන් වී ඇති ගිවිසුම යථාවත් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) <u>සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි</u>

ප්‍රාදේශීය සභාව සතු අක්කර 26, පර්චස් 34.68 ක් සභාව වෙත පවරාගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඉ) **කඹුරාවල පානීය ජල ව්‍යාපෘතිය**

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.4,209,754 ක් වැය කර පවුල් 300 කට පමණ ජලය ලබා දීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය දියත් කර තිබුණි

(i) මෙම ව්‍යාපෘතිය යටතේ ජල සම්බන්ධතාවය ලබාදීමේදී සම්බන්ධතා ගාස්තු වශයෙන් රු.5,000 ක මුදලක් ලබාගැනීමට තීරණය කර පසුව පළ කළ ගැසට් පත්‍රය අනුව එම මුදල රු.8,000 ක් ලෙස සඳහන් කර තිබුණි. කෙසේ නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විට ජල සම්බන්ධතා ලබාගත් පවුල් ඒකක ගණන 179 ක් වූ අතර රු.2,000 සිට රු.5,000 දක්වා විවිධ වටිනාකම්වලින් සම්බන්ධතා ගාස්තු අයකරගෙන ජල සම්බන්ධතා ලබාදී තිබුණි.

(ii) ජල ව්‍යාපෘතිය සඳහා යොදාගෙන තිබූ පර්චස් 10 ක් වූ ඉඩම් විධිමත් පරිදි සභාවට පවරාගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඊ) **දැන්වීම් පුවරු ආදායම්**

(i) සභාව විසින් නිසි හා ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කරමින් දැන්වීම් පුවරු ආදායම සටහන් කිරීම සඳහා ආදායම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1940 හා 2015 නොවැම්බර් 06 දිනැති ගැසට් පත්‍රයේ පළ කර ඇති ආකාරයට සභා බල ප්‍රදේශයේ සවි කර ඇති දැන්වීම් පුවරු/ ප්‍රචාරක දැන්වීම් මගින් ගාස්තු අයකරගැනීම සඳහා 2016 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(උ) **සැලසුම් කමිටු නොපැවැත්වීම**

2015 මැයි 15 න් පසු සභාව විසින් ප්‍රථම සැලසුම් කමිටුව පවත්වා තිබුණේ 2016 මාර්තු 23 දින දීය. මේ අතර තුර කාලපරිච්ඡේදය තුළ කිසිදු සැලසුම් කමිටුවක් නොපවත්වා ලේකම්වරයාගේ අභිමතය පරිදි ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර 25 ක් හා ඉඩම් සැලසුම් ඉල්ලුම් පත්‍ර 48 ක් අනුමත කොට තිබුණි.

(ඌ) **ආදායම් ඇස්තමේන්තු කිරීම**

සභාව විසින් 2016 වර්ෂයට අදාල ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී JCB යන්ත්‍රයෙන් උපයාගත හැකි ආදායම රු.2,000,000 ක් ලෙස ඇස්තමේන්තුවක් කර තිබූ නමුත් 2016 වර්ෂයට අදාලව උපයාගෙන තිබූ ආදායම රු.138,690 ක් විය.

(එ) **බෙල්ලන ගෝල්ඩන් ෆීල්ඩ් ඉඩම**

මෙම ඉඩම සභාව සතු පොදු කොටසක් වුවද එය නිවැරදිව හඳුනාගැනීමට, ඔප්පු ලබාගැනීමට හා ස්ථාවර වත්කමක් ලෙස ලේඛන ගතකිරීමට කටයුතු කර නොතිබුණි. සමුපකාර සමිතියක් මෙම භූමියේ ගොඩනැගිල්ලක් ඉදි කර ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් තිබූ අතර, පසුව සභාව විසින් මෙම ඉඩම වාර්ෂික බදු ගිවිසුමක් මත රු.750 ක මාසික බදු මුදලකට අදාල සමිතියට ලබාදී තිබුණි. 2015 වසරේ සිට මෙම මුදල රු.1,000 දක්වා ඉහල දමා තිබූ නමුත් ඉඩම බදු දීම සම්බන්ධයෙන් සභා තීරණයක් නොතිබුණි. තවද, සමිතිය සමග ඇති කර ගත් බදු ගිවිසුම 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණද ගිවිසුම අළුත් කිරීමට ක්‍රියා කර නොතිබුණි.

(ඒ) **පාසල් ළමුන් සඳහා පාවහන් ලබාදීම**

සභා බල ප්‍රදේශය තුළ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් පාවහන් ලබාදීම වෙනුවෙන් 2016 දෙසැම්බර් මස පාවහන් යුගල 4679 ක් මිලදී ගෙන ඒ වෙනුවෙන් රු.4,060,202 ක් වැය කර තිබුණි. සභා බල ප්‍රදේශයේ පාසල් 35 කින් ලබාගත් තොරතුරු මත පාවහන් යුගල් 4679 ක් ඇණවුම් කර තිබුණද පාසල් වෙත බෙදා දී තිබුණේ පාවහන් යුගල් 4326 ක් පමණි. ඉතිරි පාවහන් යුගල් 353, 2017 ජුනි 29 දින වන විටත් සභාව තුළ රඳවාගෙන තිබුණි.

(ඔ) <u>අය නොවන සේවක ණය</u>

අය විය යුතු සේවක ණය ශේෂය තුළ පැවති සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.10,953 ක ණය ශේෂයක් 2017 ජුනි 30 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) <u>භාණ්ඩ සමීක්ෂණය</u>

2016 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දුන් රු.12,217 ක් වටිනා පුස්තකාල පොත් 68 ක් අස්ථානගතවීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ක) <u>වාහන පාලනය</u>

(i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සභාවේ වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් කර නොතිබුණි.

(ii) වාහන අළුත්වැඩියා කිරීමේදී ඉවත් කරනු ලබන අමතර කොටස් ඇතුළත් කිරීම සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(iii) සභාව සතු ට්‍රේලරයක් 2011 වර්ෂයේ සිටද, ට්‍රැක්ටරයක් 2016 වර්ෂයේ සිටද අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

3.2 <u>කොන්ත්‍රාත් පාලනය</u>

<u>මාකේළිඇල්ල ආශ්‍රිතව මූලික යටිතල පහසුකම් නවීකරණය කිරීම</u>

මෙම ව්‍යාපෘතිය යටතේ රථවාහන නැවතුම, පඩි පෙල හා නැරඹුම් මධ්‍යස්ථානය අළුත්වැඩියා කර තිබූ අතර රු.2,827,474 ක මුදලක් වැය කර තිබුණි. මෙහිදී රථවාහන නැවතුම අළුත්වැඩියාව සඳහා රු.1,371,500 ක් වැය කර තිබූ නමුත් අල්ලා තිබූ කුට්ටි ගල් බොහොමයක් ගිලා බැස තිබූ බව 2017 ජුනි 29 දිනැති භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

3.3 <u>කසළ කළමනාකරණය</u>

(අ) සභාව විසින් තම කසළ කළමනාකරණ කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් පනවාගෙන නොතිබුණි.

(ආ) මෙම කාර්යයට අදාලව වග කිව යුතු නිලධාරියා ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු පත් කර තිබූ අතර එම නිලධාරියා සතියකට දින තුනක් මෙම සභාවට පැමිණිය යුතු වුවත් 2016 වර්ෂයේදී දින 14 ක් හා 2017 වර්ෂයේදී දින 07 ක් පමණක් පැමිණ තිබුණි.

(ඇ) සභාව විසින් අවසාන වශයෙන් නොදිරන කසළ එම බල ප්‍රදේශයේ මලදූගල කන්දට මුදා හරින නමුත් ඒ සඳහා පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ඈ) කසළ එක් රැස් කිරීම සඳහා සේවකයින් යෙදවීම පිළිබඳ දෛනික සේවක යෙදවුම් ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) කසල කළමනාකරණය